# පිලිසඳර
# PILISANDARA

2016
සැප්තැම්බර්/ ඔක්තෝම්බර්
pilisandara.npas@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශන
Educational and News Bulletin of the National Photographic Art Scoiety of Sri Lanka


## 41 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය











ඡායාරූප - අමිල මධුෂාන්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 41 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය සැප්තැම්බර් මස මස 02,03,04 යන දිනයන්හි කොළඹ 07 ජේ. ඩී. ඒ. පෙරේරා කලාගාරයේ දී පවත්වනු ලැබීය.

ප්‍රවීණ සංගීතවේදී ආචාර්ය රෝහණ වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන්, කලාසූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ ඇතුළු සම්භාවනීය ආරාධිත කලාකරුවන්ගේ සහභාගීත්වයෙන් ඇරඹි ප්‍රදර්ශනය, සඳහා 200 කට ආසන්න තරඟ කරුවන්ගේ කෘතීන් 1200 කට ආසන්නයකින් කෘතීන් 160 ක් ප්‍රදර්ශනය සඳහා විනිශ්චය මඩුල්ල විසින් තෝරා ගැනීම සිදුකර ඇත. මෙම තරග විනිශ්චය සදහා ප්‍රවීණ ඡායාරූප ශිල්පීන් වන රංජිත් ද සිල්වා මහතා, සංඛ සම්මාන මහතා හා ඉදුනිල් මුණසිංහ මහතා සහභාගී විය.

2014/15 වසරවල ඡායාරූප පාඨමාලා සහතිකපත්‍ර (දෙවන වසර) පිරිනැමීම ද, 2015 වසරේ සංගමයේ පාඨමාලා විද්‍යාර්ථයින් අතර පැවැත්වෙන ඡායාරූප තරගවල ජයග්‍රහකයින් සදහා තිළිණ ප්‍රදානය ද මෙදින සිදුවිය. මීගමු වෙරල වැඩමුළු ජයග්‍රාහක, වෛද්‍ය එම්. එස්. වීරකෝන් ශූරතාව සමන්ත ධර්මවර්ධන. සත්වෝද්‍යාන වැඩමුළු ජයග්‍රාහක, විල්සන් හැගෝඩ ශූරතාව ඕෂධ චමිල. කැලණි විහාර වැඩමුළු ජයග්‍රාහක, එල්. බී. එස්. එස්. බාලසූරිය ශූරතාව දිනේෂ් ජයවර්ධන. විහාරමහා දේවි වැඩමුළු ජයග්‍රාහක, බී.පී. වීරවර්ධන ශූරතාව ගිහාන් රංගන. වැඩිම මාසික තරග ජයග්‍රහණ වෙනුවෙන් පිරිනමන මාසික ඡායාරූප තරඟ ශූරතාව කසුන් රණමුක විසින් ලබා ගත්හ. වසරේ හොඳම සාමාජිකයා ලෙස හේමමාලි අල්විස් මෙනවිය සම්මාන ලැබූ අතර ප්‍රදර්ශනයේ වැඩිම ඡායාරූප ප්‍රමාණයක් ප්‍රදර්ශිත ඡායාරූප ශිල්පියා ලෙස හෙන්රි රාජකරුණා ශූරතාවය රවීන්ද්‍ර රණසිංහ හට හිමි විය.




ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

## ප්‍රමුඛ පුවත්

# 2016/17 වසර ට නව නිලධාරීහු පත්වෙති.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඡායාරූප ශිල්ප අධ්‍යයන ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 63 වන වාර්ෂික මහා සභා රැස්වීම ජූලි මස 17 වැනි දින කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. ලාංකීය ඡායාරූප කලාවේදීන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය සම්පාදනය කොට දොරට වැඩීම ඇතුළුව පසුගිය වසර තුළ සංගමය මගින් ඉටුකෙරුණු කාර්‍යභාරය මෙදින දීර්ඝ වශයෙන් විමර්ශනය කෙරුණු අතර ඒවා කාගේත් පැසසුමට ද පාත්‍ර විය.

පසුගිය ජූලි මස 17 මහවැලි කේන්ද්‍රයේ දී පවත්වන්නට යෙදුණු 63 වන වාර්ෂික මහ සභා රැස්වීම මගින් ඉදිරි වසර සඳහා නිලධාරී මඩුල්ලක් පත්කර ගන්නා ලදී. නව නිල වර්ෂයේ කටයුතු සාර්ථකව කරගැනීම සඳහා මෙම නිලධාරී මණ්ඩලය ඔබගේ පූර්ණ සහයෝගය හා ආශිර්වාදය ප්‍රාර්ථනා කරයි.







- **ගරු සභාපති**

ආචාර්‍ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා
- **ගරු විධායක අධ්‍යක්ෂ**

විජය බස්නායක මහතා
- **ගරු මුදල් අධ්‍යක්ෂ**

තිනේෂා එදිරිසිංහ මෙනවිය
- **ගරු අධ්‍යාපන අධ්‍යක්ෂ**

රාහුල පෙරේරා මහතා
- **ගරු ප්‍රදර්ශන අධ්‍යක්ෂ**

නාරද අමරතුංග මහතා
- **ගරු ලේඛකාධිකාරී අධ්‍යක්ෂ**

උපනන්ද සෙනෙවිරත්න මහතා
- **ගරු සමාජසේවා හා සුභසාධන අධ්‍යක්ෂ**

රාජා සිංහබාහු මහතා
- **ගරු සංවර්ධන අධ්‍යක්ෂ**

තුෂාර සමරකෝන් මහතා
- **ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ**

මනුජිත් කටුගම්පොළ මහතා

## ඡායාරූප ශිල්පීන් සදහා වූ ආචාර ධර්ම සංග්‍රහය ජනමාධ්‍ය අමාත්‍යවරයාට පිරිනැමේ.



ශ්‍රී ලාංකීය ඡායාරූප ශිල්පීන් වෙනුවෙන් සම්පාදිත ආචාර ධර්ම සංග්‍රහය පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා සහ නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මහතා වෙත පිලිගැන්වීම අප සංගමයේ ගරු. සභාපති ආචාර්‍ය උදිත ගයාශාන් මහතාතින් පසුගිය සැප්. 07 වන දින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී සිදුවිය. මේ සඳහා ප්‍රවීණ ඡායරූප ශිල්පී යමුනි රශ්මිකා මහත්මිය ද එක් විය.

## 2016 වර්ෂයේ LNPAS , ANPAS , FNPAS , HON.FNPAS සම්මානලාභීන්

- **වරලත් සාමාජික සම්මානලාභීන් - LNPAS**


ධර්මවිජය සෙනෙවිරත්න මහතා
- **ඇසුරු සාමාජික සම්මානලාභීන් - ANPAS**

ජයනාත් ඉලංගකෝන් මහතා, ලහිරු ජයසිංහ මහතා, සාලිය ලියනගේ මහතා, චන්දන මල්ලවාරච්චි මහතා
- **සහාගී සාමාජික සම්මානලාභීන් - FNPAS**

ඉඳුනිල් මුණසිංහ මහතා
- **ගෞරව සහාගී සම්මානලාභීන් - HON. FNPAS**

කලාසූරි සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතා, එස්.ඩී. පියදාස මහතා, නන්දනී හෙට්ටිආරච්චි මෙනවිය

# සංවර්ධන පුවත්



## ගොඩනැගිලි අරමුදලට ඔබේ දායකත්වය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත් ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු. මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, **ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට** බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.

## ගෙවීමේ ක්‍රම විධි

1. එකවර රු. 12000 ක් මුදල පරිත්‍යාග කිරීම
2. 2016 දෙසැම්බර් 31 දිනට පෙර රු. 6000 ක මුදලක් සහ 2017 දෙසැම්බර් 31ට පෙර ඉතිරි රු. 6000 ක මුදල පරිත්‍යාග කිරීම
3. මසකට රු. 1000 බැගින් මාස 12ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු.12000 ක මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශිර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයෙකු නොවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

## මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාලාභීන්

1. මංගල එදිරිසිංහ මහතා
2. එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා
3. ටී. ජී. සුනිල් වික්‍රම මහතා
4. උ. ග. ගුණසේකර මහතා
5. සා. අ. 1931
6. ටී. එස්. ටී. සිල්වා මහතා

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ මූලස්ථානය ගොඩනැගීමේ කාර්යය සඳහා මේ දක්වා රුපියල් 12000 ට වැඩි මුදල් ආධාර ලබාදුන් හවතුන්ගේ නම් ඉහත සඳහන් ය. සංගමයේ ගෞරවනීය දායකත්වය සම්බන්ධයෙන් ගෞරවය හා ස්තුතිය පිරිනමමු.**

## සංගමයට සවිය
## ඔබේ සාමාජික මුදලයි

2016 වසර සඳහා නියමිත ඔබගේ වාර්ෂික සාමාජික මුදල සංගමය වෙත ගෙවා මේ මොහොතේ ඔබේ යුතුකම ඉටුකරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු. අතපසුවීමකින් හෝ ගෙවා නැති පසුගිය වසරවල සාමාජික මුදල් ද වේ නම් ඒවා ද ගෙවා සංගමයට ශක්තියක් වීම අගය කළ යුත්තකි.

2013 වසර සඳහා සාමාජික මුදල් ගෙවා නැති සාමාජික හවතුන් සාමාජික ලේඛනයෙන් ඉවත් කිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමු. දිවයිනෙන් බැහැරව සිටින හෝ සාමාජික මුදල් ගෙවීමට අතපසු වූ ඔබේ හිතමිතුරන් සිටී නම් මේ බව ඔවුනට සිහිපත් කොට ඒ අයගේ සාමාජිකත්වය නොබිඳී පවත්වාගෙන යාමට ඔබගේ සහාය දක්වන ලෙස ද ඉල්ලා සිටිමු. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා ගරු මුදල් අධ්‍යක්ෂිකා **තිනේෂා එදිරිසිංහ මෙය අමතන්න.** (0710 934 771)

# අපේ වැඩමුළු

## ආලෝකකරණ වැඩමුළුව 2016

වාර්ෂිකව සංගමයේ දෙවන වසර විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන ආලෝකකරණ වැඩමුළුව මෙවර කළුතර, මග්ගොන ප්‍රදේශය ආශ්‍රිතව ඔක්තෝම්බර් මස 23/24 යන දෙදින පැවැත්වීමට මේ වන විට කටයුතු සංවිධානය කරමින් පවතී. ඒ සඳහා අධ්‍යාපන වැඩමුළු කමිටුව මගින් උපදේශනය ඇතුළු සම්බන්ධීකරණය සිදු කරන අතර වැඩමුළුව සංවිධානය මෙවර ද දෙවන වසර විද්‍යාර්ථීන් මගින් සිදු කරයි.

අමතන්න : **පියෝරි නිරංජන්** 0773 877 590

# ජයග්‍රහණ

### මාසික තරග ජයග්‍රහණ (විහාරමහාදේවි උද්‍යාන වැඩමුළුව - 2016 ජූනි 05)



බී.පී. වීරවර්ධන ශූරතාව
අමානි ඉරේෂිකා

■ **ඒක වර්ණ**

01. අමානි ඉරේෂිකා
02. අමානි ඉරේෂිකා
03. ගිහාන් රංගන
04. මොහාන් ගුරුසිංහ

■ **වර්ණ**

01. අමානි ඉරේෂිකා
02. අමානි ඉරේෂිකා
03. චාමික සහබන්දු
04. නිරන්ජලා අබේවික්‍රම

### මාසික තරග ජයග්‍රහණ (කැළණි විහාර වැඩමුළුව - 2016 අගෝ. 07)



එල්. බී. එස්. එස්. බාලසූරිය ශූරතාව
ගගන් කරුණාචන්ද්‍ර

■ **ඒක වර්ණ**

01. ගගන් කරුණාචන්ද්‍ර
02. කුෂාන් විමුක්ති
03. ගගන් කරුණාචන්ද්‍ර
04. ගගන් කරුණාචන්ද්‍ර
05. කසුන් රණමුක

■ **වර්ණ**

01. සුරේෂ් වීරසිංහ
02. කසුන් රණමුක
03. කසුන් රණමුක
04. බන්දුල අබේවර්ධන
05. ධනුශ නදීම්

### මාසික තරග ජයග්‍රහණ ( 2016 ජූලි 03)

■ **ඒක වර්ණ**

01. කසුන් රණමුක
02. ගගන් කරුණාචන්ද්‍ර
03. ජගත් සූරියප්පෙරුම
04. ගිහාන් රංගන
05. ලක්ෂාන් මාපා

■ **වර්ණ**

01. සුරේෂ් වීරසිංහ
02. කසුන් රණමුක
03. සුරේෂ් වීරසිංහ
04. මොහාන් ගුරුසිංහ
05. විරංග සන්දීප

*මාසික තරග සංවිධායක කමිටුව*

- *මධුරංග අබේවර්ධන - 0773 549 449*
- *සමන්ත ධර්මවර්ධන*
- *ඉසුරු රාජපක්ෂ*

## ආචාරධර්ම සංග්‍රහය ඇතුගල්පුරට හා දකුණ ලක ඡායාරූප කලාවේදීන්ට






ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් සම්පාදනය කොට ඉදිරිපත් කරන ලද ඡායාරූප ශිල්පීන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය පසුගිය අගෝස්තු 24 හා 26 වැනි දිනයන්හි ඇතුගල්පුර ඡායාරූප ශිල්පීන් වෙත හා දකුණු ලක ඡායාරූප ශිල්පීන් වෙත උත්සවශ්‍රීයෙන් යුතුව පිළිගන්වනු ලැබිණි.

කුරුණෑගල ඡායාරූප සංගමය මගින් සංවිධානය කළ එක් දින ඡායාරූප ශිල්ප වැඩමුළුවට සමගාමී ආචාරධර්ම සංග්‍රහය ජනගත කිරීම 24 වැනි දින සිදුවිය. වැඩමුළුව මෙහෙයවීම ප්‍රවීණ ඡායාරූප කලාවේදී ශාන්ත ගුණරත්න මහතා විසින් සිදුකරන ලද අතර නිල වශයෙන් ආචාරධර්ම සංග්‍රහය කුරුණෑගල ඡායාරූප සංගමයේ ලේකම් ම.ග. ජයසිංහ මහතා වෙත ශාන්ත ගුණරත්න මහතා විසින් පිළිගැන්විණි.

එමෙන්ම, 26 වැනි දින දකුණු ලක ඡායාරූප ශිල්පීන් වෙත ආචාරධර්ම සංග්‍රහය උත්සවශ්‍රීයෙන් යුතුව පිළිගන්වනු ලැබිණි. ගෝල් ප්‍රොෆෙෂනල් අයි ඡායාරූප සංගමය මගින් සංවිධානය කළ ආලෝකකරණ වැඩමුළුව මෙදින පැවැත්විණි. නිල වශයෙන් ආචාරධර්ම සංග්‍රහය පිළිගැන්වීම ප්‍රවීණ ඡායාරූප කලාවේදී ශාන්ත ගුණරත්න මහතා විසින් සිදුකරන ලද අතර, ප්‍රවීණ මංගල ඡායාරූප ශිල්පී ධම්මික ද අල්විස් මහතා විසින් ආලෝකකරණ වැඩමුළුව මෙහෙයවන ලදී.

# කමිටු පුවත්

## අනුකමිටු පත්කිරීම

සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඉදිරි කාර්යයන් සඳහා පිහිටුවන ලද කමිටු පහත සඳහන් වේ.

### සභාපතිවරයා යටතේ වන කමිටු

■ **මුලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුව**

මංගල එදිරිසිංහ මහතා
පියසේන කෝරලේව්දාන මහතා
සිතුමිණි රත්නමලල මහතා
ඉන්දික ප්‍රනාන්දු මහතා

■ **ජාත්‍යන්තර සම්බන්ධතා උපදේශන කමිටුව**

එන්. ආර්. අභයසිංහ මහතා
හෙන්රි රාජකරුණා මහතා
බන්දු ගුණරත්න මහතා
ජී. හෙට්ටිආරච්චි මහතා

■ **වෘත්තීය කණ්ඩායම**

උදේනි අල්විස් මහතා | සම්පත් පීරිස් මහතා
සාලිය ලියනගේ මහතා | ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා

### මුදල් අධ්‍යක්ෂවරිය යටතේ වන කමිටුව

■ **මූල්‍ය කළමනාකරණ කමිටුව**

කීර්ති නිශ්ශංක මහතා | හේමමාලි අල්විස් මෙය

### අධ්‍යාපන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

■ **අධ්‍යාපන කමිටුව**

සභාපති, අධ්‍යාපන අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ, ලේඛකාධිකාරී
එස්. ඩී. පියදාස මහතා | ප්‍රේමසිරි හිදැල්ලආරච්චි මහතා
සිසිර කුමාර මහතා | සමන් කුලසූරිය මහතා
ශාන්තිලාල් ප්‍රනාන්දු මහතා | සාලිය ලියනගේ මහතා

■ **අධ්‍යාපන වැඩමුළු සංවිධාන කමිටුව**

චන්ද්‍රසේන පෙරේරා මහතා
සමන්ත සේනක බණ්ඩාර මහතා
ප්‍රියන්ත අබේසුන්දර මහතා
කේ. ජී. කීර්තිරත්න මහතා
ඩී. කේ. ලැන්ට් මහතා
එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා
ප්‍රියන්ත අමරසිංහ මහතා
මනිල්ක ජයසිංහ මහතා

■ **මාසික තරග සංවිධායක කමිටුව**

මධුරංග අබේවර්ධන මහතා
සමන්ත ධර්මවර්ධන මහතා |ඉසුරු රාජපක්ෂ මහතා

### ලේඛකාධිකාරී අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

■ **විභාග පරිපාලන කමිටුව**

තිලක් ආර්. වෙරළුපිටිය මහතා | ටී.එස්.ටී. සිල්වා මහතා | එල්. බී. එස්. එස් බාලසූරිය මහතා |
රවීන්ද්‍ර ලාල් මයා | ප්‍රියන්ත අමරසිංහ මහතා |
සමන් ප්‍රනාන්දු මයා | රෝහිත ගුණවර්ධන මහතා

■ **බඳවාගැනීම් කමිටුව**

අමරා වීරසේකර මිය | ඩබ්. එම්. එස්. බණ්ඩාර මහතා
ගාමිණී ආර්. ෆොන්සේකා මහතා | ජායා අබේවර්ධන මහතා | ජේ. පී. ද අල්විස් මයා |හර්ෂ මධුරංග මයා
නෙරංජන් වික්‍රමආරච්චි මයා

### ප්‍රදර්ශන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

■ **ප්‍රදර්ශන කමිටුව**

මධුරංග අබේවර්ධන මහතා
ජයලත් ප්‍රේමවංශ මහතා
ඉසුරු රාජපක්ෂ මහතා
1 වසර - තේජා උපමාලි | ජගත් විජේවර්ධන
2 වසර - කසුන් රණමුක | ජගත් සූරියප්පෙරුම
3 වසර - සුරේෂ් වීරසිංහ

### සමාජ සේවා අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

■ **සමාජ සේවා කමිටුව**

නිමල් එදිරිතිලක මහතා
එස් රාම්දාස් මහතා
රත්නා විජේසිංහ මිය
ශ්‍යාමලී කරුණාපල මිය
නන්දනී හෙට්ටිආරච්චි මිය
1 වසර - තේජා උපමාලි | සම්පත් සඳරුවන්
2 වසර - අමිල මධුසංක | ගිහාන් රංගන
3 වසර - චන්දු ගුණවර්ධන | ජයන්ති හරිශ්චන්ද්‍ර

### සංවර්ධන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටුව

■ **සංවර්ධන අනු කමිටුව**

දුමින්ද පුෂ්පකුමාර මහතා
ඉසුරු රාජපක්ෂ මහතා
ලහිරු ජයසිංහ මහතා
චරණ බටුගහගේ මහතා
වින්දන ඒකනායක මහතා
1 වසර - චතුරංගා සමරසිංහ | චන්න මධුරංග
2 වසර - ප්‍රිශාන් පෙරේරා | ශ්‍යාම් කුමාර
3 වසර - සුරේෂ් වීරසිංහ | ලාල් හේවගේ

### ප්‍රකාශන අධ්‍යක්ෂවරයා යටතේ වන කමිටු

■ **ප්‍රචාරක කමිටුව**

ප්‍රචාරක නිලධාරී - යමුනි රශ්මිකා පෙරේරා මිය
කෙටි පණිවිඩ ප්‍රචාරණ නිලධාරී -
දනේෂ් තමින්ද මහතා
වෙබ් අඩවි සම්බන්ධීකාරක හා ''අපි NPAS'' මුහුණු පොත - ලහිරු ජයසිංහ මහතා

■ **පිළිසඳර කමිටුව**

1 වසර - මධුෂිකා ලක්මාලි | මින්දුරී අබේසේකර
චමින්ද වීරසිංහ | ගිහාන් දූල්වල
2 වසර - මදුෂිකා ලක්මාලි | ආර්. එම්. මඩවල
පියෝරි නිරංජන
3 වසර - සී. එස් . දන්තනාරායන

■ **ලංකා කැමරා කමිටුව**

ප්‍රදීප් වෙදමේස්ත්‍රිගේ මහතා
රවින්ද්‍ර පුෂ්පකුමාර මහතා
සාලිය ලියනගේ මහතා

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## උත්සව, රැස්වීම් සහ පොදු කටයුතු සංවිධානයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

### අරමුණු
සංගමයේ ගෞරවය ආරක්ෂා වන පරිදිත්, අනන්‍යතාව සුරකෙන පරිදිත්, ක්‍රමවත් හා කාර්යක්‍ෂම ලෙසත් රැස්වීම් පැවැත්වීම සහ උත්සව කටයුතු සංවිධානය මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

### අර්ථ නිරූපණය
උත්සව සහ රැස්වීම් වශයෙන් අර්ථ නිරූපණය කරනු ලබන්නේ, සාමාජිකයන්ගේ සහ විශේෂ ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් සංගමයේ සාමූහික කාර්යයක් ලෙස පවත්වනු ලබන හමුවීම්/සැසිවාර/සමාරම්භක උළෙල/සමාප්ති උත්සව යනාදිය වේ. සංගමය මගින් සංවිධානය කරනු ලබන චාරිකා, වැඩමුළු, සමාජසේවා ව්‍යාපෘති සඳහා මෙහි සඳහන් වගන්ති ප්‍රමාණාත්මක ව අදාළ කරගැනීම අපේක්ෂිත ය.

### නිර්දේශ
1. පොදු කොන්දේසි.
   - 1.1. සෑම උත්සවයක් ම සහ රැස්වීමක් ම පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් තරම් කල්වේලා ඇති ව සාමාජිකත්වය වෙත දැනුම් දිය යුතු ය.
   - 1.2. උත්සව සහ රැස්වීම් සංවිධානය පිළිබඳ මූලික වගකීම සමස්ත අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් දරනු ලබන අතර, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණය පරිදි ඕනෑ ම එක් අධ්‍යක්‍ෂවරයෙකුට හෝ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් කිහිප පොළකට උත්සව සංවිධාන වගකීම භාරගත හැකි ය.
   - 1.3. උත්සවයක් හෝ රැස්වීමක් පිළිබඳ කරනු ලබන කවර හෝ පෞද්ගලික හෝ පොදු දැනුම්දීමක සංගමයේ නිල නාමය (සිංහලෙන් හෝ/සහ ඉංග්‍රීසියෙන්) සඳහන් විය යුතු අතර, අවශ්‍ය නම් නිල ලාංඡනය ද භාවිත කළ හැකි ය.
   - 1.4. සංගමයේ වගකීම යටතේ සංවිධානය කෙරෙන සෑම උත්සවයක්, රැස්වීමක් සඳහා ම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඒකමතික අනුමැතිය අවශ්‍ය කෙරේ.
   - 1.5. උත්සව සහ රැස්වීම්වල දී සංගමයේත්, සාමාජික භවතුන්ගේත්, පිටස්තර ආරාධිතයින්ගේත්, ගෞරවය හා සුහදතාව සුරකෙන අයුරින් හැසිරීම හා ක්‍රියාකිරීම සියලු සාමාජිකයින්ගේ වගකීම වේ.
     - 1.5.1. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ වාතාවරණය සකස් කිරීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීමකි.
     - 1.5.2. යථෝක්ත වාතාවරණය උල්ලංගනය කිරීමට ක්‍රියාකරන සාමාජික භවතුන් සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් පත්කරනු ලබන විනය කමිටුවක් මගින් අවශ්‍ය පියවර ගත යුතු ය.
   - 1.6. උත්සව, රැස්වීම් හා අනිකුත් සාමූහික කාර්යයන්හි දී මූල්‍ය හා ද්‍රව්‍යමය අවශ්‍යතා සඳහා පිටස්තර අනුග්‍රාහක භවතුන් සම්බන්ධ කරගැනීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ එකඟතාව අනුව සිදු කළ යුතු වේ.
   - 1.7. සාමාජිකයන්ට අදාළ සෑම රැස්වීමක් ම නිල සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක හෝ, සාමාජික සංඛ්‍යාව සියය ඉක්මවීමෙන් හෝ පැවැත්විය හැකි ය.
   - 1.8. කිසියම් නොවැළැක්විය හැනි හේතුවක් නිසා උත්සවයක් හෝ රැස්වීමක් නොපවත්වන්නේ නම්, ඒ බව අවම වශයෙන් දින තුනකට වත් පෙර හැකි කවර හෝ ආකාරයකින් ආරාධිත පාර්ශවයන් වෙත දැනුම් දිය යුතු වේ.

### 02. මහා සභා රැස්වීම
සංගමයේ වාර්ෂික, අර්ධ වාර්ෂික හා විශේෂ මහා සභා රැස්වීම්වල ආරාධනා පත්‍රය ශාලා සැලසුම හා ක්‍රියාදාමය පියවර 08ක් යටතේ මෙයට ඇතුළත් වේ.

### 03. උත්සව
උත්සව සභාවන්හි දළ න්‍යාය පත්‍රය හා දළ සැලසුම හා ක්‍රියාදාමය පියවර 08 ක් යටතේ මෙයට ඇතුළත් කර ඇත.

### 04. වෙනත් සැසිවාර, සම්මන්ත්‍රණ, චාරිකා, වැඩමුළු සහ සමාජසේවා ව්‍යාපෘති
මෙම වැඩසටහන්වල ක්‍රියාදාමය හා සැලසුම් කටයුතු පිළිබඳ පියවර 04 කින් කරුණු දක්වා ඇත.

### 05. සාමාජික සුහද හමුව
වාර්ෂික හෝ ද්විවාර්ෂික සුහද හමුවක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් පියවර 04 ක් යටතේ මෙහි සඳහන් වේ.

### 06. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්
මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය හා ක්‍රියා පිළිවෙත පියවර 04 ක් යටතේ මෙහි සඳහන් වේ.

# සමාජ සේවා පුවත්

## වාර්ෂික සමාජ සත්කාරය - 2016

## සින්නවත්ත - මඩකලපුව



(2015 මුලතිව් සමාජ සත්කාරයේ මතකයන්)

සංගමයේ නිර්මාතෘ විල්සන් හැගොඩ මැතිඳුන් ප්‍රමුඛ අප අතරින් වියෝ වූ සාමාජික, සාමාජිකාවන් සමරනු වස් වාර්ෂික සංවිධානය වන සමාජ සේවා වැඩසටහන යටතේ, මෙවර පාසැල් සිසුන් වෙත අධ්‍යාපනික පොත්, අභ්‍යාස පොත් හා පාසැල් උපකරණ පරිත්‍යාග කිරීමට කටයුතු යොදා ඇත.

පසුගිය යුද සමයේ දී පීඩාවට පත් මෙම දරුවන්, මේ වන විට ද දැඩි දුෂ්කරතා මැද අධ්‍යාපනය ලබන බැවින් ඔවුන් වෙත පරිත්‍යාග කිරීම සඳහා ඉහත ද්‍රව්‍ය හා ඔබගේ මුදල් ආධාර ඔක්තෝම්බර් මස 10 වන දිනට පෙර සංවිධායක කමිටුව වෙත ලබා දෙන්න.

පන්ති පැවැත්වෙන දිනයන්හි දී මහාබෝධි විදුහලේදී ද, පහත සඳහන් ස්ථානයන්ට ද ඉහත ද්‍රව්‍ය භාරදිය හැකි අතර මුදල් ආධාර ලංකා බැංකුව, බම්බලපිටිය ශාඛාවේ අංක 717752 දරන ගිණුමට ද බැර කළ හැකිය.

අනුර රාජා සිංහබාහු (අධ්‍යක්ෂ)
සමාජ සේවා හා සුබ සාධන 0773 734 786

නන්දනී හෙට්ටිආරච්චි (සංවිධායිකා) 0776 840 586

නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ
0112 670 190

නාරද ස්ටූඩියෝ - 101/ A /1 /1 දුටුගැමුණු වීදිය
කොහුවල. 077 033 5426

## විල්සන් හෑගොඩ සැමරුම නිමිත්තෙන් විහාරමහා දේවී දැරියන්ට සවියක්





කොළඹ 10 මරදාන, ඩීන්ස් පාරේ විහාරමහා දේවි විද්‍යාලයේ ගංවතුරින් අවතැන් වූ සිසු දැරියන් දස දෙනෙකු සඳහා සම්පූර්ණ පාසල් උපකරණ ඇතුළු ඇඳුම් කට්ටල පසුගිය සැප්. 13 වන දින සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන්ගේ සහභාගීත්වයෙන් පරිත්‍යාගකරන්නට යෙදුණි.

මේ සඳහා කොළඹ ආදි නාලාන්දීය ඡායාරූප කලා සංගමයේ නොමඳ දායකත්වය ලැබුණි. මේ පිළිබඳව ආදි නාලන්දීය ප්‍රසන්න ඉරෝෂන් මහතා ඇතුළු සාමාජික පිරිසට විශේෂ ස්තුතිය.

# අපගේ ශෝකය

- අප ජ්‍යෙෂ්ඨ සාමාජික සම්පත් පීරිස් මහතාගේ දයාබර මාමණ්ඩිය ගේ අභාවය ද
- අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික හා ජාත්‍යන්තර සම්මානලාභී ඡායාරූප ශිල්පී වෛද්‍ය උදාර ආරියසිංහ මහතාගේ ආදරණීය පියාණන් ගේ අභාවය ද
- යාවජීව සාමාජිකාවක වන ගංගා නිල්මිණී අමරසිංහ (LM 075) මහත්මියගේ දයාබර පියාණන් ගේ අභාවය ද
- යාවජීව සාමාජික පියසෝම කෝරළේවිදාන මහතාගේ දයාබර නැන්දනිය මෙන් ම ජ්‍යෙෂ්ඨ සාමාජිකා අනෝමා කෝරළවිදාන මහත්මියගේ මෑණියන් සහ එන්. ඒ. කෝරළෙවිදාන මහතාගේ දයාබර මිත්තණිය ගේ අභාවය ද
- සංගමයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයෙකු මෙන් ම පළමු අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වන ඒ. ඩී. ධර්මසේන මහතාගේ දෙවු සොයුරිය කලක් රෝගතුර ව සිට අභාවය ද
- ප්‍රවීණ ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පී ශ්‍රී ලාල් ගෝමස් මහතා ගේ අභාවය ද
- අප සංගමයේ පළමු වසර සාමාජික මධුරංග සමරනායක මහතාගේ දයාබර පියාණන් ගේ අභාවය ද,

දැනුම් දෙනුයේ අප සංගමයේ ඉතාමත් සංවේගයෙන් යුතුවය.

# ප්‍රකාශන පුවත්

## පිළිසඳරට ඔබේ අතහිත

පිළිසඳර ඔබේ අතට පත්වීම දක්වා වූ ක්‍රියාවලිය ඇතුළත අපට දැරීමට සිදුවන මූල්‍යමය වෙහෙස සඳහා ඔබට ද අනුග්‍රහය දැක්විය හැකි ය.


අමතන්න : මනුජිත් (0716450871)

## පිළිසඳර ඩිජිටල් වී මුහුණු පොතට ද එක් වෙයි

මෙතෙක් මුද්‍රිත මාධ්‍යයෙන් පමණක් ඔබ අතට පත් වූ පිළිසඳර කලාපය. මෙම කලාපයේ සිට මුහුණු පොතේ facebook.com/PilisandaraNPAS මගින් ද ඔබට ලබා ගත හැක.

## ඔබේ තොරතුරුත් පිළිසඳරට ලියන්න

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට. ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.



**ගරු. ප්‍රකාශන අධ්‍යක්‍ෂ,**
**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**
**නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.**
Email: pilisandara@gmail.com / kmanujith@gmail.com

# අධ්‍යාපන පුවත්

## ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය (2014/ 2015)


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වසර 66 ක දීර්ඝ කීර්තිමත් ඉතිහාසයට එක්වන තවත් ස්වර්ණමය දිනක් ඉදිරි ජනවාරියේ දී උදාවීමට නියමිතය. තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ව අවසන් කර 2014/2015 වසරවලට අදාළ විද්‍යාර්ථීන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය ඉදිරි ජනවාරියේ පැවැත්වීමට මේ වන විට කටයුතු සූදානම් වෙමින් පවතී.

අමතන්න : ලහිරු (0718008076)

## 03rd SUNDAY සැප්තැම්බර් 18 සිට

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ඡායාරූප ඩිප්ලෝමාව අවසන්කර නික්මුණු සහෘද ඔබ හා ඡායාරූප ශිල්පය හා ලැදි සංගමයේ ජ්‍යෙෂ්ඨ සහෘදයින් වෙනුවෙන්. සෑම මසකම තෙවන සති අන්ත ඉරිදා දිනය සුහද අධ්‍යාපනික කතිකාවතක් පැවැත්වෙනවා. ඡායාරූප ශිල්පය සිනමාව හා රූපවාහිනී මාධ්‍යය අදාළ ප්‍රවීණයින් සමග අත්දැකීම් බෙදාහදා ගන්නට ඔබට ලැබෙන මේ විරල අවස්ථාවට එක්වන ලෙසයි මේ දයාබර ඇරයුම.




■ *පළමු පියවර සැප්. 18 - ප්‍රවීණ ඡායාරූප කලාවේදී සරත් පෙරේරා මහතා සමග සුහද කතා බහක්.*

**එන්න මාසෙකට වතාවක් අපි හරවත් අරුත්බර දේ ගැන කතා කරමු**

*අධ්‍යාපන අධ්‍යක්ෂ රාහුල පෙරේරා මහතාගේ මෙහෙයවීමෙන්, අධ්‍යාපන කමිටුව මගින් මෙම වැඩසටහන සංවිධානය කෙරේ.*

අමතන්න : රාහුල - 0777309432 | සාලිය - 0713969129

## NPAS Film Workshop 2016



සිනමාකරණයට ලැදි සහෘද ඔබ වෙනුවෙන් සංවිධානය වන කෙටි සිනමාකරණය පිළිබඳව වැඩමුළුවක් ඉදිරි ඔක්තෝම්බරයේ පැවැත්වීමට නියමිතයි.

***ඉක්මනින්ම විස්තර කියන්නම්..***


පිළිසඳරට වෙහෙස මහන්සිය

ප්‍රකාශන අධ්‍යක්‍ෂ - මනුජිත් කටුගම්පොළ

පිළිසඳර ප්‍රකාශන අනුකමිටුව

1 වසර: මධුෂිකා ලක්මාලි/මින්දුරි අබේසේකර
චමින්ද වීරසිංහ/ ගිහාන් දූල්වල
2 වසර: මදුෂිකා ලක්මාලි/ආර්. එම්. මඩවල/
පියෝරි නිරන්ජන්
3 වසර: චින්තක දන්තනාරායන